නිපුණතාව 5 - සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වය සැලකිල්ලට ගනිමින් ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.

සාර්ව ආර්ථික අරමුණු

සමස්ත ආර්ථික ක්‍රියාකාරීත්වය තුළින් සමාජයක් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන ආර්ථික අරමුණු-මේවා සමස්ත සමාජයේ පොදු යහපැවැත්ම උදෙසා ළඟා කර ගැනීමට අපේක්ෂා කරන ආර්ථික අරමුණුය.

1.පූර්ණ සේවා නියුක්තිය - වැඩ කළ හැකි වයසේ පුද්ගලයින් අතරින් වැඩ කිරීමට සූදානම් සියලුම පුද්ගලයින්හට යෝග්‍ය රැකියා පැවතීම.

2.මිල ස්ථායීතාව- ආර්ථිකයේ සියලු භාණ්ඩ හා සේවාවල සාමාන්‍ය මිල නැතිනම් මිල මට්ටම දැඩි උච්චාවචනවලින් තොරව පවත්වා ගැනීම.

3.බාහිර ස්ථායීතාව - විදේශ විනිමය ලැබීම් හා ගෙවීම් සමාන මට්ටමකින් පවත්වා ගැනීම සහ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම.

4.සාධාරණත්වය - සමාජයේ පුද්ගලයන් අතර ආදායම හා ධනය සමානව බෙදී යාමේ තත්ත්වය

5.ආර්ථික වර්ධනය - රටක මූර්ත නිමැවුම දිගුකාලීන වශයෙන් ඉහළ යාම.මෙහිදී නිමැවුම සමඟ නිශ්පාදන ධාරිතාවද ඉහළ යා යුතුය.

6.තිරසාර සංවර්ධනය - අනාගත පරපුරේ වුවමනා ඉටු කර ගැනීමට ඇති හැකියාවට හානියක් නොවන ආකාරයට වර්තමාන පරපුර විසින් ළඟා කර ගන්නා දියුණුව.මෙහිදී ආර්ථික,සමාජීය හා පාරිසරික යන පැතිකඩ තුනම සමබරව පවත්වා ගත යුතුය.

අභ්‍යාස

1.සාර්ව ආර්ථික විචල්‍යයන් නම් කරන්න.

2.මූලික සාර්ව ආර්ථික ගැටළු මොනවාද?

3.සාර්ව ආර්ථික ප්‍රතිපත්ති 3 නම් කර පැහැදිලි කරන්න.